# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2221/57 - 2021 අප්‍රේල් මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2021.04.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 24/51 (VII)

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 126 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**ගාමිණී ලොකුගේ,**
ප්‍රවාහන අමාත්‍ය.

2021 මාර්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2021 අංක 1 දරන මෝටර් වාහන (රියදුරු බලපත්‍ර වලංගු කාලසීමාව තාවකාලික දීර්ඝ කිරීමේ) නියෝග ලෙස හඳුන්වනු ලැබේ.

2. (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ VII වන කොටස යටතේ මෝටර් වාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කර ඇති, එම රියදුරු බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති පරිදි, 2021 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වී 2021 සැප්තැම්බර් මස 30 වැනි දිනයෙන් අවසන් වන කාල සීමාව තුළ කල් ඉකුත් වීමට නියමිත සෑම රියදුරු බලපත්‍රයකම වලංගු කාල සීමාව එකී කල් ඉකුත් වීමේ දිනය සිට මාස හය (06) කින් මෙයින් දීර්ඝ කරනු ලැබේ.

3. මේ නියෝග, (2021 ජනවාරි මස 18 වන දිනැති අංක 2211/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝගයෙන් අවසන් වරට සංශෝධිත) 2020 ජුනි මස 17 වැනි දිනැති අංක 2180/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2020 අංක 3 දරන මෝටර් වාහන (රියදුරු බලපත්‍ර වලංගු කාල සීමාව තාවකාලිකව දීර්ඝ කිරීමේ) නියෝග මගින් දැනටමත් වලංගු කාල සීමාව දීර්ඝ කර ඇති රියදුරු බලපත්‍රයක් සඳහා අදාළ නොවිය යුතු ය.

1A - PG 5237 — 525 (2021/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*